

# රවිබන්දු විද්‍යාපති නම් හේ

ඔහු ශ්‍රී ලංකාවේ බෙරවාදන, නර්තන, මුද්‍රා නාට්‍යය හා වේදිකා ඇඳුම් නිර්මාණ සැලසුම් ශිල්පයේ පුරෝගාමියෙකි. සමකාලීන හා සම්ප්‍රදායික නර්තන කලාවේ සුවිශේෂී සළකුණක් වු සෝමබන්දු විද්‍යාපතිගේ පුත්‍ර රත්නයකි. මුද්‍රා නාට්‍යය කලාවේ හා එහි රංග වින්‍යාසය පිළිබඳව හසල දැනුමක් ඇති පඬිවරයෙකි. චිත්‍රසේන, වජිරා, පනීභාරත වැනි ශ්‍රේෂ්ඨයන්ගෙන් පසු අප රටේ නර්තන කලාවට හිමි වු සම්පතකි. විශ්ව විද්‍යාල ආචාර්යවරයෙකි. ලෝක පුජිත බිලි කොබ්හැට් හා සාකීර් හුසේන් වැන්නවුන් සමඟ එකම වේදිකාවක් තුළ අනගි ස්වර රටා ප්‍රසාංගික කොට වත්මන් පරපුරේ හදවත් තුළ නොමෙකෙන සළකුණක් තැබූ නර්තන කලාවේ අභීත සළකුණකි. ඔහු ඒ සියල්ලටම වඩා තම දක්‍ෂතා තුලින් නව පරපුරට ළං වූ, සරල චාම් සුහදශීලී සැමටම කටපුරා "රවි සර්" කියා කිව හැකි මිතුරු සොඳුරු හිතවතෙකි. හේ රවිබන්දු විද්‍යාපති නම් වෙයි. මේ ඔහු සමඟ කළ කෙටි පිළිසඳරකි.

**මුලින්ම ඔබ පිළිබඳව හැඳින්වීමක් කළොත්?**

මං නර්තන රංගන වින්‍යාස, සංගීත හා තාල වාද්‍ය ශිල්පියෙක්. මම පැවත එන්නේ පාරම්පරික නර්තන පරපුරකින්. 1940 ආරම්භයේ සිට ශ්‍රී ලංකාවේ නර්තන ඇඳුම් පැළඳුම් ශිල්පයේ පුරෝගාමියෙක් වූ සෝමබන්දු විද්‍යාපති මගේ පියා. ඔහු පාරම්පරික පන්සල් චිත්‍ර ශිල්පි පරපුරකට අයත් කලාකරුවෙක්. මව් පාර්ශවයෙන් මං අල්ගම ග්‍රාමයේ මහා ගුරු වූ කිරි ගණිත ගුරුන්නාන්සේගේ මුනුපුරෙක්. මගේ සීයා උඩරට නැටුම් කලාවේ විශිෂ්ඨයෙක්. පනීභාරත චිත්‍රසේන, වසන්ත කුමාර වැන්නවුන්ගේ ගුරුවර යෙක්. නමුත් මා පසුව නර්තනය, සංගීතය, චිත්‍රය වැනි ශිල්පය හැදෑරුවේ 1972 සිට චිත්‍රසේන වජිරා කලායතනයෙන්. මා ඔවුන් යටතේ උඩරට නර්තනය හෙම හදාරල 1981 වෙස් බැඳීම තබනවා.

එයින් පසු මගේ බිරිඳ සමන්ති සමග 1982 රවිබන්දු සමන්ති නර්තනායතනය පිහිටුවා ගන්නවා. ඇයත් චිත්‍රසේන වජිරා යටතේ නර්තනය හැදෑරූ සෞන්දර්ය විශ්ව විද්‍යාලයේ උපාධිධාරනියක්. එසේම මාගේ නිර්මාණ අභ්‍යාසයන් පිළිබඳව හැඳින්වීමක් කළොත් මා සම්ප්‍රදායික නර්තනය මුද්‍රා නාට්‍ය කලාව වේදිකාව මත ප්‍රතිනිර්මාණය කරනවා. මොඩර්න් ඩාන්ස් වගේ දේවල්. එසේම මගේ නිර්මාණ ධාරාවේ ජනප්‍රිය වූ නිරමාණකරණයක් තමයි පෙර මූලික සංගීතය. ඒවා විවිධ පර්යේෂණාවලට භාජනය කරමින් නව නිර්මාණ බිහිකරමින් මා වේදිකාවට ගෙන එනවා. එසේම මා විශ්ව විද්‍යාල බොහොමයක නව නර්තන හා රංග වින්‍යාස කලාව, සංධව් නිර්මාණ කලාව පිළිබදව බාහිර කතිකාචාර්යවරයෙක් ලෙස සේවය කරනවා.

**මුද්‍රා නාට්‍ය කලාව විශ්ව විද්‍යාල මට්ටමෙන් නොයෙක් පර්යේෂණ වලට භාජනය වුවත් අද එය ජනතාව අතර ප්‍රචලිත කලා මාධ්‍යයක් බවට පත් වෙලා නැහැ. ඇත්තටම එයට අද ප්‍රේක්‍ෂයන් ප්‍රමාණයක් නැති තරම්. ඒ පිළිබදව ඔබේ විග්‍රහය කෙබඳුද?**

ඔබ හරි. ඇත්තටම මුද්‍රා නාට්‍ය කලාව මේ වනවිට ජනතාව අතරට ගිහිල්ලා නැහැ. ජනගත වෙලා නැහැ. එවැනි නාට්‍ය රංග වින්‍යාස කලාවකට බුද්ධිමත් ප්‍රේක්ෂකයන් පිරිසක් අවශ්‍යයි. එසේම එවැනි බුද්ධිමත් ප්‍රේක්ෂක පිරිසක් හදන්න නම් එවැනි නාට්‍යය වැඩි වැඩියෙන් නිර්මාණය වෙන්න ඕනේ. ඒවාට විශාල පිරිවැයක් දරන්න ඕනේ. එවැනි නිර්මාණ වලට රාජ්‍ය මට්ටමෙන් හෝ අනුග්‍රහය ලැබිම අවශ්‍යයයි. මේ කලාව රංග වින්‍යාස කිහිපයක් එකතු වි එනම් නර්තනය, ඇඳුම් පැළඳුම් සංගීතය, අංගරචනය, ගායනය, ආලෝකය ආදී සියල්ලන්ගේම මිශ්‍රණයක්. එහෙත් අද ඒ සියල්ලෙන්ම පරිපුර්ණ වූ කලාකරුවන්ද අප අතර ඇත්තේ නැහැ. හිටියත් අතේ ඇඟිලි තරමින් ගණන් කළ හැකි බොහෝ සුළු පිරිසක්. 1940 දශකයේ චිත්‍ර කුමාර, ප්‍රේමකුමාර, ශේෂා පලිහක්කාර වැනි ශිල්පින්ගෙන් මුද්‍රා නාට්‍ය කලාව ආලෝකමත් වුණා. 1960 කාලයේ මෙය උසස් මට්ටමක තිබුණා. අසූව අනූව දශකවල ඇතිවු සමාජ ආර්ථික පෙරළිවලින් පසු ඇති වූ වෙනස් කම් කලාවටත් බලපෑවා.ඒ ඇති වූ වෙනස්කම් අනෙක් සියලු කලා මාධ්‍යයන්ටත් බලපෑවා කිව්වොත් නිවැරදියි. සරල සිල්ලර දේ සොයාගෙන යන ප්‍රේක්ෂකයන් පිරිසක් බිහිවිම නිසා රසඥතාව පහළ වැටීම තුලින් මෙවැනි උසස් නිර්මාණවල අභාවය වළක්වන්න බැහැ. එහෙත් මෑතකදී බිහි වූ මහා සමයම උසස් නිර්මාණයක්. එහෙත් එයට දරන පිරිවැයක් එක්ක එවැන්නක් පවා ඉදිරියට ගෙනයෑම දුෂ්කරයි. එවැනි බොහෝ ගැටළු මුද්‍රා නාට්‍ය කලාවට බලපෑවා.

**කැන්ටාටාව, ඔපෙරාව හා මුද්‍රා නාට්‍යය අතර වෙනස කුමක්ද?**

මුද්‍රා නාට්‍යය කියන්නේ නර්තනය මුලික කරගත් කලා මාධ්‍යයක්. ඉංග්‍රිසියෙන් බැලේ කියල කියන්නේ. ඒ වගේ නර්තනයක් මගින් කෙරෙන්නෙ කිසියම් කලාත්මක පණිවිඩයක් අදහසක් ඉදිරිපත් කිරිමක්. නමුත් කැන්ටාටාව ඔපෙරාව කියන්නේ සංගීතය මුලික කරගත් කලා මාධ්‍යයන් දෙකක්. විශේෂයෙන්ම කැන-ටාටාව කියන්නේ බටහිර සම්භාව්‍ය සංගීතය මුල් කරගත් එක්තරා ගායනා ආකෘතියක්. ඔපෙරාව කියන්නේ රංගනය, සංගීතය, ගායනය සමඟින් ඉදිරිපත් කෙරෙන කලාවක්.

**ඈත අතීතයේ ගොයම් නෙලීමට යොදාගත් සංගීත භාණ්ඩයක් තමයි බුම් මැඩිය. එහෙත් අද බුම් මැඩිය වැනි සංස්කෘතික අංග අභාවයට ගිහිල්ලා. මිනිස්සු යන්ත්‍ර සුත්‍රවලට වහල් වෙලා තියෙනවා රටක සංවර්ධනය කියන්නේ එයමද?**

සංස්කෘතිය හා සංවර්ධනය කියන්නේ සංකල්ප දෙකක් වුනත් මේ දෙකම දෙකම බැදි දෙපළක්. රටක දියුණුවට මේ දෙකම බලපානව. සංස්කෘතියෙන් තොර සංවර්ධනයකුත් නැහැ. සංවර්ධනයෙන් තොර සංස්කෘතියකුත් නැහැ. බුම් මැට්ටම කියන්නේ තාල වාද්‍යය භාණ්ඩයක්. එය ගොයම් නෙලිමේදි මහන්සිය, කාන්සිය මග හරවා ගන්නට, එකමුතුකම රැක ගන්නට යොදා ගත් නාද රටාවක්. සංස්කෘතිය මොහොතින් මොහොත කාලෙන් කාලයට වෙනස් වෙන දෙයක්.

එහෙත් සංවර්ධනය යනු සීඝ්‍රයෙන් වෙනස් වෙන දෙයක්. යන්ත්‍ර සුත්‍ර, කෘමිනාශක, ජන අනුපාතය , කුසගින්න, රැකියා, මුදල් හා ආර්ථිකය හමුවේ එය වේගවත් වෙනවා. එතෙනදී සංස්කෘතික ගුණාංග යටපත් වෙනවා. මිනිස් මොළයෙන් වැඩ ගත්තත් ප්‍රඥාව යටකරගෙන සංවර්ධන අවශ්‍යතා මතුවෙනවා. එහෙත් රටකට සංවර්ධය වගේම, එම රටට හිමි උසස් සංස්කෘතික ගුණාංගද බොහෝ ම වැදගත්. එය උපරිමයෙන් රැකගෙන තමයි රටක් සංවර්ධනය කළ යුත්තේ.






ලක්ෂ්මන් කොඩිතුවක්කු

**ඈත අතීතයේදී ලෙඩරෝග සුව කිරිමට දෙවොල්මඩු, ගම්මඩු ,කොහොඹ කංකාරිය වැනි ශාන්ති කර්ම යොදා ගත්තා. එහෙත් අද ඒවා ක්‍රම ක්‍රමයෙන් අභාවයට යනවා. මිනිස් චිත්ත සන්තානය සුව කිරිමට එයින් බලපෑමක් වුනාද? එසේම නවින වෛද්‍ය විද්‍යාව හමුවේ එය පරාජය ලැබුවාද?**

අතීතයේ විවිධ ලෙඩරෝග හා සම්බන්ධ මානසික ව්‍යාකුලතා සුව කිරිමට මෙම ශාන්ති කර්ම යොදා ගත්තා. මෙය මනෝ චිකිත්සක එසේත් නැතිනම් සයිකෝ තෙරපි ලෙසින් භාවිතයට ගත්තත් ඒවා ශාරිරික ලෙඩ රෝග සුව කරන්න යොදාගත්තේ නැහැ. ඕනෑම දෙයක් කාලයක් තිස්සේ සියවස් ගණනාවක් පවත්වාගෙන එනවිට එයින් ජනතාව බැහැර විම වළක්වාලීමට, පසුකාලීනව එයට නැටුම් ගැයුම් වැයුම් එකතු වෙලා ප්‍රාසාංගික කලාවක් බවට පත් වෙනවා. පහන් කුඩු, ගම් මඩු, තොවිල් යාගහෝම, සන්නි යාග, දෙවොල් මඩු, කොහොඹ කංකාරිය වැනි ශාන්තිකර්ම ප්‍රාසාංගික වෙන්නේ ඒ අනුව. එහෙත් පසුකාලීනව ඉක්මන් සුවය, සහනය බලාපොරොත්තු වූ වත්මන් ජනතාව එයින් ඈත් වූවත්, යටිහිතේ තැන්පත්ව ඇති (විශේෂයෙන් ආසියානු මහද්වීපය තුළ) සංස්කෘතික ආකර්ශණය එය ප්‍රාසාංගික හා කලාත්මක කලාවක් ලෙස නරඹන තත්වයට පත්වෙලා තිබෙනවා. එයින් ලබන තෘප්තිය තුලින් තවමත් එය රැකගැනීමට හැකියාව ලැබී තිබෙනවා. එය වඳවෙලා නැහැ. අඩුවෙන් හෝ තවමත් එය අපරට තුළ දැකගත හැකියි.

**අප රටේ ජන සංගීතය. ජන නාද රටා නිර්මාණ, අද රටේ පවතින බාල බොළඳ නිර්මාණ රැල්ල හමුවේ අභාවයට යමින් පවතිනවා. ඒවා විකෘති කරමින් ඔවුන් වේග රිද්ම රැප් ගීත ආදිය නිර්මාණය කරනවා. මෙය රටක සංස්කෘතික පරිහානිය කියා මා කිවහොත්**

ඔබ හරි. සංස්කෘතික වශයෙන් ඉහළ දේ අතහැර දමමින් බාල බොළඳ සරළ සිල්ලර දේ සොයාගෙන යන තරුණ පරපුරක් බිහිවෙමින් පවතිනවා. ඒ අතර මේවා රැකගන්නට වෙර දරුණ අතලොස්සක් වත්මන් පරපුර අප අතර සිටියත්, ඒ දිරිය අමතක කරමින් ඒවාට අනුබල දෙන රූපවාහිනී, එෆ්එම් නාලිකාද බිහිවෙලා තියෙනවා. ඒ තුළින් අපේ දේශීය සංගීතය නාද රටා නිර්මාණවලට ලැබෙන්නේ අඩු ඉඩ ප්‍රස්ථාවක්. මේවාට නිසි පිළියම් නොයෙදෙව්වොත් ඇතිවන සංස්කෘතික පරිහානිය ඉහළයි. අපි ලොවට ගෙන යා යුත්තේ අපේම අනන්‍යතාවය රැකගත් සංස්කෘතික කලාවක් මිසක් අංගවිකල සංස්කෘතික රටාවක් නොවෙයි. නර්තන විෂය පැත්තෙන් ගත්තත් අද අපරට තුළ ඇත්තේ " නිවැරදි නර්තන කලාවක් " නොවෙයි. අද බොහෙමයක් නටන්නේ ජනප්‍රියත්වය සොයාගෙන යන නැටුම් කලාවක්. එම විෂය ජනප්‍රිය ධාරාවට අසුවී සොබාවිත නර්තන කලාව නැතිවී යන තත්වයකට පත්වෙලා තියෙනවා. අද තරුණ පරපුර බොහෝ දුරට රසවිඳිමට මෙන්ම නර්තනයට යොමුවීමට පවා පටන්ගෙන ඇත්තේ එම ජනප්‍රිය නර්තන රටාව ඔස්සේ යමින්, ඕනෑම රටක ජනප්‍රිය හා සොබාවිත කලාවක් තිබෙනවා. ඔවුන් ඒවා තේරුම් බේරුම් ඇතිව රසවිඳිනවා. එහෙත් අද අප රට එහෙම තත්වයක් දකින්නට ලැබෙන්නේ නැහැ. බොහෝ මාධ්‍යයන්ද මේවාට වගකිව යුතුයි.

**පහතරට, උඩරට, සබරගමු වැනි නැටුම් සම්ප්‍රදායන් අපිටම ආවේනික වූ අපිට හිමි කලාවක්ද ? නැතිනම් ඉන්දියානු සම්ප්‍රදාය තුළින් අපිට උරුම වූවක්ද ?**

දකුණු ආසියානු කලාපය තුළ ඇති සංස්කෘතික කලාපීය ලක්ෂණ එනම් චිත්‍ර, මූර්ති, නැටුම්, සංගීතය වැනි දෑ බොහෝ සමානකමක් දක්වනවා. එසේම කිසියම් සමාජයකට රටකට සංස්කෘතික බලපෑමක් කළ හැක්කේ ඒ ආසන්නයේම ඇති මහා ශිෂ්ඨාචාරය හා මහා සම්ප්‍රදායය මගින්. අපිට ආසන්නයේම ඇත්තේ භාරතය. ඒ බලපෑම අපිට උරුම වෙලා තියෙනවා. ඔබ කිවූ පරිදි මේ සියලුම නර්තන කලාවන්වල ශ්‍රී ලාංකික අනන්‍යතාවයට යටපත්ව භාරතීය ලක්‍ෂණ දකින්නට ලැබෙනවා. පර්සියානු, අප්‍රිකානු, බටහිර කලාප වැනි දෑ තුළත් එහෙමයි. ඔවුන්ගේ කලාව තුළත් ඒ ආසන්නයේ ඇති මහා ශිෂ්ඨාචාරයේ බලපෑම ලැබිල තියෙනවා. දැන් අපේ බොහෝ ශාන්ති කර්ම ගත්තත් ඒවාවල ඉන්දියානු කේරළ සම්ප්‍රදායන් හා භාරතීය මූලයන් දක්නට ලැබෙනවා. දැන් සබර කියන්නේ වැද්දන් හැඳින්වීමට යෙදෙන තවත් නමක්. සබරගමු නර්තන කලාව තුළ අපේම බොහෝ සංස්කෘතික ලක්ෂණ ගැබ්වී ඇති බැව් විද්වතුන් සොයාගෙන තිබෙනවා. කෙසේ වෙතත් අපිට හිමි බොහෝ කලාවන් තුළ භාරතීය කලාත්මක ලක්ෂණ අපේ අනන්‍යතාවය යටින් ගැබ්වෙලා තියෙන බව අපි පිළිගත යුතුයි.

**අපරට තුළ කලාකරුවන්ගේ "කඩේයාම" නොහොත් දේශපාලඥයන් පසුපස යාම සුලභ මාතෘකාවක්. එයින් කලාකරුවන් තුළ බෙදීමක් ඇතිවෙලා තියෙනවා. මේ "කඩේයාම" තුළින් කලාවේ පරිහානියක් දක්නට ලැබෙනවා යයි මම කිවහොත් එයට ඔබගේ අදහස ?**

දැන් උදාහරණයක් වශයෙන් බර්ටෝල්ට් බ්‍රෙස්ට් වැනි නිර්මාණ කරුවෙකු ගත්තොත් ඔහු සමාජ අසාධාරණය වෙනුවෙන් තම නිර්මාණතුළින් සෘජුවම දායකත්වයක් දක්වලා තිබෙනවා. සමාජ පෙරළියකටත් එම නිර්මාණවල ප්‍රබල දායකත්වයක්

38 වන පිටට